---

එරාවූර් නගර සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

---

1 මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 18 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 මැයි 29 දින ඉදිරිපත් කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 27 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව එරාවූර් නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට එරාවූර් නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදන සංචිතය සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ආ ) වර්ෂය අවසානයට අතැති තොගවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි භෞතිකව හර වැරදි බැලූ වටිනාකමට නොව පොත් අගයට දක්වා තිබුණි .

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.2,859,080 ක් වූ අතර , එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු .2,329,833 ක් විය .

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| ( i) වරිපනම් සහ බදු | 2,100 | 1,769 | 331 |
| ( ii ) කල්බදු කුලී | 3,365 | 2,850 | 515 |
| ( iii ) බලපත්‍ර ගාස්තු | 656 | 537 | 119 |
| ( iv ) වෙනත් ආදායම් | 1,320 | 1,353 | - |

2.2.2 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ වෙනත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවියයුතුව තිබුණු මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,500,000 |
| (ii) | මුද්දර ගාස්තු | 400,000 |

2.3 අවිධිමත් ගනුදෙනු

----------------------

ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකොට සමාලෝචිත වර්ෂය තුල රු.1,659,019 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය .

( අ ) ආදායම් පරිපාලනය

( ආ ) වත්කම් කළමණාකරණය

s/s .